විගණකාධිපති චක්‍රලේඛ අංක - 2017/07 2017 පෙබරවාරි දින

විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72
පොල්දූව පාර
බත්තරමුල්ල

සියළුම නිලධාරීන් වෙත,

**විදේශ ශිෂ්‍යත්ව සහ පුහුණු වැඩමුළු සඳහා ලියාපදිංචි වීම**

---

විදේශ ශිෂ්‍යත්ව සහ පුහුණු වැඩමුළු සඳහා නාම යෝජනා කිරීමට දෙපාර්තමේන්තුවට ලැබෙන කාලය ඇතැම් විට ඉතා සීමිත වන බැවින්, එම අවස්ථාවලදී වෙන වෙනම අයදුම්පත් කැඳවීම අසීරු කරුණක් වන බව පෙනේ. එබඳු අවස්ථාවල විශේෂයෙන් අයදුම්පත් කැඳවීම සිදු නොකර ජ්‍යෙෂ්ඨතාවය, කුසලතාවය, විදේශ ගමන් සඳහා පෙර සහභාගීවීම, ශිෂ්‍යත්ව හෝ පුහුණු වැඩමුළුවලට භාජනය වන විෂයය හා සහභාගී විය යුතු යැයි දන්වා තිබෙන නිලධාරියාගේ තනතුරු ස්වභාවය යන කරුණු මත පදනම්ව ඉහලම සුදුසුකම් ලබන නිලධාරියා හෝ නිලධාරීන් ඒ සඳහා නම් කිරීමට ඉදිරියේදී ක්‍රියා කරනු ඇත.

2. එම තෝරාගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන් සියළු තොරතුරු ඇතුළත් කරමින් විදේශ ශිෂ්‍යත්ව සහ පුහුණු වැඩමුළු සඳහා ලියාපදිංචි වීමට මේ සමඟ ඇති ඇමුණුම ප්‍රකාරව අයදුම් කළයුතු අතර, ඉහත පරිදි කටයුතු කිරීමේදී එසේ ලියාපදිංචි වී ඇති නිලධාරීන්ගෙන් වඩාත්ම සුදුසු නිලධාරියා හෝ නිලධාරීන් තෝරාගනු ලැබේ.

3. විදේශ සංචාර සඳහා සහභාගීවීමට අපහසු හා මනාප නොවන නිලධාරීන් ලියාපදිංචිය සඳහා අයදුම් නොකළ යුතු අතර, තෝරාගත් නිලධාරියකුට ඒ අනුව කටයුතු කළ නොහැකි නම් නොපමාව ඒ බව ලිඛිතව දැනුම් දිය යුතුව ඇත.

4. නාම යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ඇති අවස්ථාවලදී මෙතෙක් භාවිතා කළ පරිදි චක්‍රලේඛ මඟින් නිවේදනය කරනු ලබන අතර, මෙම චක්‍රලේඛය යටතේ ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීමට අවශ්‍ය නොවේ.

5. මේ සඳහා දත්ත පද්ධතියක් සකස් කෙරෙන අතර, සියළුම නිලධාරීන්ගේ තොරතුරු සහ ඔවුන් වෙත ලබාදී ඇති විදේශ සංචාරවල තොරතුරු ඇතුළත් කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යෑමට කටයුතු කෙරෙන බැවින්, කිසිදු නිලධාරියකු වෙත විශේෂ සලකා

බැලීමක් මෙන්ම නොසලකා හැරීමක්ද සිදු නොවීමට කටයුතු යොදා ඇත. දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ මෙම දත්ත ඇතුළත් කිරීමට ද කටයුතු කරනු ඇත.

6. විදේශ සංචාරයේ ස්වභාවය පරිදි ඉහත සඳහන් කර ඇති එක් එක් නිර්නායකයන් පදනම් කරගෙන නිර්දේශවන නිලධාරීන් සඳහා වන අනුමැතිය මා විසින් ලබාදෙනු ඇත.

විගණකාධිපති

ආදර්ශ අයදුම් පත්‍රය

----------------------

( විදේශ ශිෂ්‍යත්ව සහ පුහුණු වැඩ සටහන් සඳහා )

01. නිලධාරියාගේ නම :-

මයා/මිය/මෙය

02. අනුයුක්ත කණ්ඩායම :-

03. උපන් දිනය :-

04. (අ) වර්තමාන තනතුරට

පත්වූ දිනය :- (i) වි.අධි. II – I

(ii) වි.අධි. II – II

(iii) වි.ප. I

(iv) වි.ප. II

(ආ) එම තනතුරේ ස්ථිර කළ දිනය :-

05. විගණකාධිපති දෙපාර්තමේන්තුවට පත්වූ දිනය :-

06. අධ්‍යාපන සුදුසුකම් :-

07. වෘත්තීය සුදුසුකම් :-

08. භාෂා පිළිබඳ දැනුම ( ඉතා හොඳයි/හොඳයි/සාමාන්‍යයි/දුර්වලයි/ නොහැකි )

| භාෂාව | කියවීම | ලිවීම | කතාකිරීම |
| --- | --- | --- | --- |
| ඉංග්‍රීසි | | | |
| සිංහල | | | |
| දෙමළ | | | |

09. විදේශ සංචාර පිළිබඳ විස්තර :-

(මෙම දෙපාර්තමේන්තුවේ සේවා කාලය තුළ හෝ පූර්ව සේවා කාලයක් වේ නම් එම සේවා කාලය තුළ වෙනත් දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත ආයතනයක, මූල්‍ය අනුග්‍රහය මත සහභාගීවූ සියළුම විදේශ සංචාර ඇතුළත් කළ යුතුය. )

| | <u>රට</u> | <u>කාලසීමාව</u> | <u>සිට - දක්වා</u> |
|---|---|---|---|
| (i) ශිෂ්‍යත්ව | | | |
| (ii) සම්මන්ත්‍රණ | | | |
| (iii) පුහුණු වැඩමුළු / සංචාර | | | |
| (iv) විගණන පරික්ෂණ | | | |

ඉහත දැක්වෙන තොරතුරු සත්‍ය, සම්පූර්ණ හා නිවැරදි බව ප්‍රකාශ කරන අතර, අසත්‍ය / අසම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හා විනය කටයුතු වලට හේතු වන බවද දනිමි.

දිනය :- අයදුම්කරුගේ අත්සන

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :- ශාඛා භාර විගණන අධිකාරි

අංශ ප්‍රධානි

අධ්‍යක්ෂ (පරිපාලන)